# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2114/26 - 2019 මාර්තු මස 13 වැනි බදාදා - 2019.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ජේ/00/1/14/6

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ගරු අබේරත්න හේරත් මුදියන්සේලාගේ උපාලි අබේරත්න මැතිතුමා, විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු සරෝජිනී කුසලා වීරවර්ධන මැතිනිය, විශ්‍රාමික මහාධිකරණ විනිශ්චයකාර
3. එම්. කේ. ඩී. විජය අමරසිංහ මැතිතුමා, විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති

වෙත,

සුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වැනි අධිකාරය) 2 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වර්ෂ 2019 ජනවාරි මස 14 වැනි දිනැති අධිකාරි පත්‍රය මගින්, මවිසින් පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින් ද,

තවද, එකී පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කොමසාරිස්වරුන් වන විශ්‍රාමික විගණකාධිපති පස්දුන්කෝරලේ ආරච්චිගේ පේමතිලක මැතිතුමා සහ විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ලලිත් ආර්. ද සිල්වා මැතිතුමා සිය ධුරයන්ගෙන් ඉල්ලා අස්වී ඇති හෙයින් ද,

තවද, එමගින් ඇතිවූ පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ ඇති හෙයින් ද,


1A - G 29384 — 387 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්. කේ. කේ. කුමාරසිරි මැතිතුමා සහ විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති එම්. පී. ධර්මවර්ධන මැතිතුමා, එතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, ඉහත කී අධිකාරි පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහනවයක් වූ මාර්තු මස 12 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.